# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 29 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදීම පිළිබඳ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 ජූලි මස 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 අගෝස්තු මස 03 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබා ගත හැකිය.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 29 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදීම පිළිබඳ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1973 ජූලි මස 26 වන දින]

එල්. ඩී.—ඕ. 35/67.

**1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදීම පිළිබඳ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1973 අංක 29 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදීම පිළිබඳ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදීම පිළිබඳ පනතේ 34 වන වගන්තියේ, "බලයලත් නිලධාරි තැන" යන්නේ අර්ථකථනය වෙනුවට පහත සඳහන් අලුත් අර්ථකථනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1956 අංක 47 දරන පනතේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

' "බලයලත් නිලධාරි තැන" යන්නෙන්—

(අ) කම්කරු කොමසාරිස් ;

(ආ) යම් නියෝජ්‍ය හෝ සහකාර කම්කරු කොමසාරිස් වරයෙක් ; හෝ

(ඇ) මේ පනතේ කාර්යයන් සඳහා—

(i) කම්කරු දෙපාර්තමේන්තුවේ අන් කිසි නිලධාරියකු සම්බන්ධයෙන් වූ විට කම්කරු කොමසාරිස් විසින්, හා

(ii) ආණ්ඩුවේ අන් කිසි දෙපාර්තමේන්තුවක නිලධාරියකු සම්බන්ධයෙන් වූ විට ඒ දෙපාර්තමේන්තුව භාරව සිටින අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍ය වරයා විසින්

බලය පවරනු ලැබූ නිලධාරියකු වශයෙන් පත් කරනු ලබන යම් නිලධාරියෙක්

අදහස් වේ.'.

මුද්‍රණ 22278 0 807 (73/7)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.